# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.03.12 පැය 0600 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/ 490/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

**01. තියුණු ආයුධවලින් පහරදී කාන්තාවක් ඝාතනය කිරීමක් - දඹගල්ල පොලිස් වසම.**

2025.03.11 වන දින උදෑසන කාලයේ දඹගල්ල පොලිස් වසමේ කොලොන්කඳපිටිය ප්‍රදේශයේ නිවසක් තුල කාන්තාවක් පුළුස්සා ඝාතනය කර ඇති බවට දඹගල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 55 ක් වූ කොලොන්කඳපිටිය, දඹගල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරියට තියුණු ආයුධවලින් පහරදී පුළුස්සා ඝාතනය කර ඇති බවට සිදුකරනලද විමශර්න අනුව අනාවරණය වී ඇති **අතර සිද්ධිය සම්බන්ධයෙන් වයස අවුරුදු 35 ක් වන මරණකාරියගේ පුත්‍රයා, වයස අවුරුදු 30 ක් වන දියණිය සහ වයස අවරුදු 34 ක් වන මරණකාරියගේ ලේලිය** අත්අඩංගුවට ගෙන ඇත.

මෘත ශරීරය මොණරාගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර දඹගල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. ටී56 වගර්යේ ගිනි අවියක්, එම උණ්ඩ, බෝර 12 වගර්යේ ගිනි අවියක් හා එම පතරොම් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.**

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාළව බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2025.03.11 වන දින උදෑසන කාලයේ අත්තනගල්ල පොලිස් වසමේ වැලිකඩමුල්ල ප්‍රදේශයේදී ටී56 වගර්යේ ගිනි අවියක්,එම මැගසින් 02ක් හා ජීව උණ්ඩ 133ක්ද, බෝර 12 වගර්යේ ගිනි අවියක් හා එම අවිය සඳහා භාවිතා කරනු ලබන ජීව පතරොම් 06ක්ද සමගින් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 70ක් වන අත්තනගල්ල ප්‍රදේශයේ පදිංචි හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙකි.**

වැඩිදුර විමශර්නයේදී සැකකරුට අයත් අක්කර 25ක පමණ ඉඩමක මෙම ගිනි අවි සඟවා තිබියදී සොයා ගෙන ඇත. බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

මෙම වැටලීමට අදාල ඡායාරූපයක්



**03.** **නීතිවිරෝධී මත්පැන් හා හෙරොයින් ජාවාරම සිදු කරන ලද සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම සහ දේපල ක්‍රියා විරහිත කිරීම - නීතිවිරෝධී වත්කම් විමශර්න කොට්ඨාසය.**

නීති විරෝධී මත්පැන් විකිණීම හා හෙරොයින් ජාවාරම සිදු කරන ලද සැකකරුවන් දෙදෙනෙකු සම්බන්ධයෙන් නීතිවිරෝධී වත්කම් විමශර්න කොට්ඨාසය විසින් සිදු කරන ලද වැඩිදුර විමශර්න අනුව ඔවුන් මුදල් විශුද්ධිකරන පනත යටතට ගැනෙන වැරදි සිදු කර ඇති බවට අනාවරණය වීමෙන් පසු 2025.03.11 වන දින දහවල් කාලයේදී ජාඇල පොලිස් වසමේ ඒකල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 39 හා 63 යන වයස්වල පසුවන ජාඇල ඒකල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

නීතිවිරෝධී මත්පැන් ජාවාරම හා හෙරොයින් ජාවාරම තුලින් උපයා ගත් දේපල වන රුපියල් 23,500,000/-(ලක්ෂ දෙසිය තිස් පහක්) වටිනා වෑන් රථයක් හා කාර් රථයක්ද, රුපියල් 1,200,000/- (ලක්ෂ දොලහක්) වටිනා ත්‍රීරෝද රථයක් හා රුපියල් 1,900,000/- (ලක්ෂ දහනවයක්) වටිනා ඉඩමක්ද ක්‍රියා විරහිත කිරීමේ නියෝග ලබා ඇත.

නීතිවිරෝධී වත්කම් විමශර්න කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**04.** **හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය**

2025.03.11 වන දින දහවල් කාලයේ තලංගම පොලිස් වසමේ සුහද මාවත ප්‍රදේශයේදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 50 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන හෝකන්දර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදු කල වැඩිදුර විමශර්නයේදී කොටුව හා කොට්ටාව පොලිස් වසම් වල යතුරුපැදි සොරකම් කිහිපයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු

බවට අනාවරණය වී ඇති අතර සොරකම් කරන ලද යතුරුපැදියක් හා තවත් යතුරුපැදියක අංක තහඩු 02ක් සොයා ගෙන ඇත.

බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2025.03.11 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ අත්තිඩිය ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 500 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සීදූව පොලිස් ස්ථානය.**

2025.03.11 වන දින සවස් කාලයේ සීදූව පොලිස් වසමේ ජයවධර්නපුර හන්දිය අසලදී සීදූව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 400 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන කටුනායක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සීදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පෑලියගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කායර්ංශය.**

2025.03.11 වන දින උදෑසන කාලයේ පෑලියගොඩ පොලිස් වසමේ මීගහවත්ත වැලිපාර ප්‍රදේශයේදී පෑලියගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 100 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පෑලියගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන පෑලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොට්ඨාස අපරාධ විමර්ශන අංශය කොළඹ උතුර.**

2025.03.11 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ කැළණි පාලම අසලදී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 980ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පෑලියගොඩ පොලිස් ස්ථානය.

2025.03.11 වන දින රාත්‍රී කාලයේ පෑලියගොඩ පොලිස් වසමේ වැල්ඩිස් වත්ත ප්‍රදේශයේදී පෑලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 18 ක් වන පෑලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.

2025.03.11 වන දින දහවල් කාලයේ වැලිකඩ පොලිස් වසමේ බණ්ඩාරනායකපුර ප්‍රදේශයේදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.

2025.03.11 වන දින රාත්‍රී කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ ඔරුවල ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලි ග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන ඔරුවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සේරුනුවර පොලිස ස්ථානය.

2025.03.11 වන දින රාත්‍රී කාලයේ සේරුනුවර පොලිස් වසමේ මහින්දපුර ප්‍රදේශයේදී සේරුනුවර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන ඊච්චලම්පත්තුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සේරුනුවර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 13. ආහාර විෂවීමකින් පාසල් ළමුන් රෝහල් ගත කිරීමක් - කරදියනාරු පොලිස් වසම.

2025.03.11 වන දින උදෑසන කාලයේ කරදියනාරු පොලිස් වසමේ පිහිටි පාසලක ළමුන් සඳහා ඇති ආපන ශාලාවකින් ආහාර ලබා ගත් ළමුන් 53 පමණ අසනීප වීම හේතුවෙන් කරදියනාරු රෝහල වෙත ඇතුලත් කර ඇති බවට කරදියනාරු පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

අසනීප වූ සිසු සිසුවියන් 31 දෙනෙකු මඩකලපුව රෝහලේ හා 13 දෙනෙකු කරදියනාරු රෝහලේ ප්‍රතිකාර ලබන අතර අනෙක් සිසුන් ප්‍රතිකාර ලබාගෙන නිවෙස් වලට පිටව ගොස් ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරික්ෂකවරයා පැමිණ පරික්ෂණ කටයුතු සිදු කර ඇති අතර කරදියනාරු පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - වවුනියාව පොලිස් වසම.

2025.03.11 වන දින උදෑසන කාලයේ වවුනියාව පොලිස් වසමේ වෙලික්කුලම් - මාමඩුව මාගර්යේ මාමඩුව හන්දිය ආසන්නයේදී වෙල්ලිකුලම් දෙස සිට මාමඩුව දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාගර්ය හරහා ගමන් කළ පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව වවුනියාව රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 63 ක් වූ නෙඩුම්කුලම් ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය වවුනියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ යතුරුපැදිකරු අත්අඩංගුවට ගෙන ඇත. වවුනියාව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**